**ශීර්ෂය 123 - නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, ඒ හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයය අංක 02-03-02-1503 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන වැඩ සටහන සඳහා පරිපූරක ඇස්තමේන්තු අංක 5531 යටතේ ලද රු.28,460,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ ලැබී ඇති ප්‍රතිපාදන ලෙස ගිණුමෙහි දක්වා තිබුණි. | පරිපූරක හා මු.රෙ. 66 නිවැරදි ලෙස ගිණුමේ සටහන් කළ යුතු වීම. | වැය විෂය අංක 02-03-02-1503 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන වැඩසටහන සඳහා පරිපූරක ඇස්තමේන්තු සඳහා ලද රු.28,460,000 ක මුදල අතපසු වීමකින් මු.රෙ 66 යටතේ ලැබීමක් ලෙස ගිණුමෙහි සඳහන්ව ඇත. |
| (ආ) | වෙනත් ලැබීම් රු.25,544,280 ක් ගිණුමෙහි දක්වා තිබුණද ඊට අදාල විස්තර ගිණුම සමග ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් සමග අදාල විස්තර ඉදිරිපත් කළ යුතු වීම. | රු.25,544,280 ට අදාල විස්තර කඩිනමින් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ගිණුම් අනුව මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.276,442,420 ක් වුවද වත්කම් ලේඛනය අනුව වටිනාකම රු.9,685,160 ක් විය. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) හි දෙවන පරිශිෂ්ඨය ප්‍රකාරව ආයතනය සතු වත්කම්වලට අදාල සියලු විස්තර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ලේඛනයෙහි හා මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | නිවැරදි ශේෂයන් හදුනා ගැනීමෙන් පසුව ලබාදීමට කටයුතු කරමි. |
| (ආ) 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ අංක MF/CG/02/(Cir) චක්‍රලේඛය අනුව සෑම රාජ්‍ය ආයතනයක්ම සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් අමාත්‍යාංශය විසින් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කල තොරතුරු අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.257,511,861 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු.276,442,420 ක් විය. ඒ අනුව රු.18,930,559 වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ අංක MF/CG/02/(Cir) හා 2017 ජුනි 28 දිනැති චක්‍රලේඛය අනුව ආයතනයේ සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතු වීම. | නිවැරදි ශේෂයන් හදුනා ගැනීමෙන් පසුව ලබාදීමට කටයුතු කරමි. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම අනුව වැඩ තහනමකට ලක්වූ නිලධාරියෙකුගෙන් වර්ෂ 02 කට වැඩි කාලයක සිට හිඟහිටව තිබූ ණය ශේෂවල එකතුව රු.199,460 ක් විය. | කඩිනමින් ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අදාල නිලධාරියා මියගොස් ඇති අතර ඔහුට කරුණාසහගත දීමනාවක් ගෙවන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කර ඇති අතර එම දීමනාව ලද වහාම අදාල ණය මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි II පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය. | මූල්‍ය නොවන වත්කම් ලේඛනය - වහාම යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදි. |
| (ආ) **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පැවැත්විය යුතු වීම. | මෙම ලේඛනය වහාම ආරම්භ කිරීම සඳහා මුදල් අංශයේ නිළධාරීන්ට දන්වා ඇති අතර එය විගණනය සඳහා ඉදිරිපත් කල හැක. කෙසේ වුව ද අමාත්‍යාංශයේ වාහන සඳහා වන හානි ලේඛණයක් දැනට පාලන අංශය මඟින් පවත්වා ගෙන යනු ලැබේ. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. | 2019 සිට අදාල වාර්තාව විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 94 | මුදල් රෙගුලාසි 94 අනුව බැරකම් කිසිම විටෙක ප්‍රතිපාදන මුදල් ඉක්ම නොවිය යුතු වුවද වැය විෂයන් 08 ට අදාලව රු.314,125 ක්වූ බැරකම් ප්‍රතිපාදන මුදල් ඉක්මවා දරා තිබුණි. | මුදල් රෙගුලාසි 94 දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සඳහන් කර ඇති රු.314,125 ක මුදලින් රු.250,255 ක් නිළධාරින්ගේ අතිකාල සහ ඉන්ධන සඳහා වැය වු මුදල් වේ. ඉතිරි බැදීම් ද අවශ්‍යතාවය මත කරන ලද බැව් සලකන්න. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන | එකතු කළ අගය මත බදු | ප්‍රසම්පාදන | VAT ගෙවීම සම්බන්ධ |

| | | | |
|---|---|---|---|
| මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 5.4.12 | ගෙවීම් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේද අනුව ක්‍රියා කළ යුතු වීම. | විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06(i) , (ii) සහ 07 ඡේදයන් | කාර්තුවක් අවසානයේ එළඹෙන මස 15 වන දිනට ප්‍රථම කාර්තුව තුළදී අලුතින් එකතුවූ වාහන, වාහන අපහරණය කිරීම්, හා වෙනස්වීම් පිළිබඳ තොරතුරු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කල යුතුය. | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06(i), (ii) සහ 07 අනුව ක්‍රියා කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයට වෙන්කර තිබූ රු.11,389,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.9,643,761,105 ක් සමාලෝචිත වර්ෂය තුල උපයෝජනය කර තිබූ අතර එය වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 85 කි. | වියදම් පැහැදිලිව හඳුනාගෙන අවශ්‍යතාවයට අනුව ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතු වීම. | මූලධන වැය විෂයන් වූ ඉතිරිවීම්වලට ප්‍රධාන වශයෙන් පසුගිය වසර අගදී රටේ පැවති තත්වය බලපා ඇති බව සලකන්න. |
| (ආ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී | වියදම් පැහැදිලිව හඳුනාගෙන | 2018 වසර අවසානයේ රටේ පැවති තත්වය මෙම |

| | | | |
|---|---|---|---|
| | වියදම් පැහැදිලිව හඳුනා නොගැනීම හේතුවෙන් වැය විෂයන් 18 කට අවශ්‍යතාවයන්ට වඩා සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. | අවශ්‍යතාවයන් අනුව ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතු වීම. | ඉතිරිවීම්වලට හේතු විය. |
| (ඇ) | වැය විෂය අංක 01-01-1408 මෙහෙයුම් කල්බදු යටතේ වාහනයක් මිලදී ගැනීම සඳහා වාරික වෙනුවෙන් රු.5,940,000 ක් වෙන් කරවා ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ එවැනි වාහනයක් මිලදී ගෙන නොතිබුණි. එම ප්‍රතිපාදනය මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | වත්කම් මිලදී ගැනීමේ අවශ්‍යතාවයන් හඳුනා ගෙන ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු වීම. | රු.5,940,000 ක ප්‍රතිපාදන වෙන් කරවා ගත්තද අමාත්‍යාංශය විසින් පසුව වාහන මිලදී ගැනිම අත් හිටවන ලදී. |
| (ඈ) | මූලික වියදම් ඇස්තමේන්තු හා තථ්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 123 දක්වා වූ පරාසයක වෙනස්වීම් නිරීක්ෂණය වූ අතර එම වෙනස්වීම්වලට හේතු ගිණුමෙහි ඒසීඒ - 2(iii) හි දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශයෙහි ඒසීඒ 2 **(iii)** අනුව මූලික වියදම් ඇස්තමේන්තුව හා තථ්‍ය වියදම් අතර වෙනස්වීමට හේතු ඉදිරිපත් කළ යුතු වීම. | ඉතිරිවීම් සඳහා සති දෙකක් ඇතුලතදී හේතු ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. (ඉදිරිපත් කර නැත) |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එහෙත් එම සැලැස්ම වර්ෂය තුළ අවස්ථා දෙකකදී වෙනස් කර තිබූ අතර වර්ෂය අවසාන වී මාස දෙකකට පසුව එනම් | ක්‍රියාකාරී සැලැස්ම වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් වර්ෂය තුලදී වෙනස් කිරීම්වලට භාජනය කිරීම, අදාල අනුමැතින් අනුව කළ යුතු අතර වර්ෂය අවසන් | අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට අයත් නිවාස හා යටිතල පහසුකම් සැලසීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසුවත් අවස්ථානුකූලව එය වෙනස් කර පසුව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව |

| | | |
|---|---|---|
| 2019 මාර්තු 12 දිනද 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම වෙනස් කර තිබුණි. | වීමෙන් පසු ක්‍රියාකාරී සැලැස්මේ වෙනස් කිරීම් නොකල යුතු වීම. | 2018 වර්ෂයේ අවසාන භාගයේ කර ඇති වෙනස් කිරීම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම වෙනස් කරන ලදි. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ආදර්ශ ගම්මාන වැඩසටහන (නව)**<br>මේ සඳහා 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 937 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව දරා ඇති වියදම රු.මිලියන 581 කි. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 62 ක් විය. වර්ෂයේ ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව 20,375 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ වශයෙන් හා වහල දක්වා නිම කර තිබූ නිවාස, ඉදිකිරීම් සංඛ්‍යාව 1,555 ක් වූයෙන් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 8 ක් පමණක් විය. | නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වන පරිදි සැලසුම් සකස් කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| **(ආ) විසිරි නිවාස ව්‍යාපෘතිය (නව)**<br>මේ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 709 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව දරා ඇති වියදම රු.මිලියන 637 ක් වීමෙන් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 90 ක් වුවද ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව 7,000 න් වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිමකල නිවාස 4,879 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 70 කි. | - එම - | - එම - |
| **(ඇ) උතුරු පළාත් නිවාස වැඩසටහන (නව)**<br>මේ සඳහා 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,401 න් රු.මිලියන | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| | 1,844 ක වියදම් දරා තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 77 ක් විය. ඉලක්කගත නිවාස 5,000 න් වහල දක්වා හා සම්පූර්ණ වශයෙන් නිම කළ නිවාස 4,511 ක් වීමෙන් ඉලක්කගත නිවාස සංඛ්‍යාවෙන් සියයට 90 ක් පමණක් ඉදිකර තිබුණි. | | |
| (ඇ) | **බෝගස්වැව විශේෂ නිවාස ව්‍යාපෘතිය (අවිච්ඡේද)**<br>------------------------------------------------ | | |
| | ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 449 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට දැරූ වියදම රු.මිලියන 200 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 45 ක්ද ඉලක්කගත නිවාස 1,566 න් වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිම කල නිවාස 978 ක් වීමෙන් භෞතික ප්‍රගතිය සියයට 62 ක් විය. | - එම - | - එම - |
| **(ඉ)** | **විරු සුමිතුරු නිවාස වැඩසටහන (නව)**<br>----------------------------------------- | | |
| | රණවිරු අධිකාරිය හා ඒකාබද්ධව ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියට 2018 වර්ෂයේ ප්‍රතිපාදන මුදල රු.මිලියන 116 ක් විය. දරන ලද වියදම රු.මිලියන 113 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 97 ක් විය. එහෙත් වර්ෂයේ ඉලක්කගත නිවාස සංඛ්‍යාව වූ නිවාස 550 න් වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිම කර තිබූ නිවාස 405 ක් වීමෙන් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 74 ක් පමණක් විය. | - එම - | - එම - |
| **(ඊ)** | **ග්‍රාම ශක්ති උදාගම්මාන නිවාස වැඩසටහන (නව)**<br>------------------------------------------------ | | |
| | මේ සඳහා වර්ෂයේ ඇස්තමේන්තු මුදල රු.මිලියන 100 ක් වුවද අමතර ප්‍රතිපාදන ඇතුළුව 2018 වර්ෂයේදී දරා තිබූ වියදම් රු.මිලියන 234 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 234 කි. එහෙත් වර්ෂය තුළ ඉලක්කගත නිවාස සංඛ්‍යාව නිවාස 1,200 ක් වුවද වහල දක්වා සහ සම්පූර්ණ වශයෙන් නිම් නිවාස සංඛ්‍යාව 255 ක් වීමෙන් භෞතික ප්‍රගතිය සියයට 21 ක් පමණ විය. | - එම - | - එම - |

**(ඇ) ආදර්ශ ගම්මාන වැඩසටහන (අවිච්ඡේද)**

| | | |
|---|---|---|
| ඉහත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ ඇස්තමේන්තු කළ මුදල රු.මිලියන 632 ක් වුවත් දරා ඇති වියදම් රු.මිලියන 486 කි. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 76 ක් විය. ඉලක්කගත නිවාස 4,960 න් නිමකර තිබූ නිවාස සංඛ්‍යාව 3,099 ක් පමණක් විය. වහල සම්පූර්ණ වූ නිවාස 1,743 ක් ද වහල මට්ටම දක්වා නිම කර ඇති නිවාස 664 ක් වූ අතර මෙම ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 30 දින අවසන් කළ යුතු වුවද ප්‍රමාද කාලය මාස 03 කි. | - එම - | - එම - |

**(ඈ) ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන (අවිච්ඡේද)**

| | | |
|---|---|---|
| මේ සඳහා 2018 වර්ෂයේ ඇස්තමේන්තු කළ මුදල රු.මිලියන 543 න් දරා තිබූ වියදම රු.මිලියන 316 වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 58 ක් විය. ඉලක්කගත නිවාස 1,301 න් නිම කල නිවාස සංඛ්‍යාව 844 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 65 ක් විය. ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 30 දින අවසන් කළ යුතු වුවද ප්‍රමාද කාලය මාස 03 ක් විය. | - එම - | - එම - |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාවර තාක්ෂණික කමිටු (Standard Technical Committee) අනුමැතීන් ලබා දීම පිළිබඳ පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| i. 2014 මැයි 20 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය ආයතනවල ඉදිකිරීම් සඳහා වූ ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමට එවා තිබූ කොන්ත්‍රාත් ලිපිගොනු 71 කට 2018 වර්ෂය අවසාන වන විටත් ඇගයීම් කර අනුමැතිය ලබා දී නොතිබුණි. | ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතීන් ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු වීම. | කමිටුවට ඉදිරිපත් කළ කොන්ත්‍රාත් ලිපිගොනුවල අදාල විස්තර නොලැබීම, ඇගයීම් කටයුතු සියයට 95 ක් අවසන් කලද අයිතම කිහිපයක තොරතුරු නොලැබීම, වැඩ විෂයන් වෙනස්වීම, කොන්ත්‍රාත් අවසන් නොවීම හා පාදක වර්ෂය වෙනස්වීම යන කරුණු හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | | | ඇගයීම් අවසන් කල නොහැකි විය. |
| **ii.** | 2015 දෙසැම්බර් 23 දින සිට 2018 ඔක්තෝබර් 18 දින දක්වා ස්ථාවර තාක්ෂණික කමිටුව විසින් අනුමැතිය ලබා දුන් කොන්ත්‍රාත් සඳහා අවුරුදු 06 ට වැඩි කාලයන් ගතකර තිබූ බව නිරීක්ෂණය විය. | ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතීන් ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු වීම. | අනුමැතිය ලබාදීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල තීරණ හා සංදේශ නොලැබීම, අදාල ආයතනයෙන් ප්‍රමාණවත් විස්තර නොලැබීම වැඩ විෂයන් කිහිපයක් අවසන් නොවීම වැනි කරුණු හේතුවෙන් ඇගයීම් අවසන් කිරීමට නොහැකි වී ඇත. |
| iii. | ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතීන් සඳහා කොන්ත්‍රාත් ආයතනවලින් එවන ලද අනුපිළිවෙල ගැන නොසලකා කොන්ත්‍රාත් ඇස්තමේන්තු වටිනාකම් ඇගයීමට ලක් කර මාසයක් වැනි කාලයකින් අනුමැතීන් ලබා දී තිබුණ ද තවත් සමහර කොන්ත්‍රාත් වටිනාකම් සඳහා අනුමැතිය ලබා දීමට වර්ෂ 01 සිට වර්ෂ 06 අතර කාලයක් ප්‍රමාද වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතීන් ලබා දීමේදී ආයතනවලින් එවන ලද අනුපිලිවෙල ගැන සැලකිලිමත් විය යුතු වීම. | සමහර ආයතන වලින් ලැබෙන ප්‍රතිචාර ප්‍රමාදවී සිදු වන හෙයින් එවනු ලබන අනුපිළිවෙලට අනුමැතිය ලබා දීමට නොහැකි වී ඇත. කමිටුව පරීක්ෂා කර අඩුපාඩු දැනුම් දුන්නද ලැබෙන ප්‍රතිචාර ප්‍රමාද වීම, එකම ආයතනයට ලැබෙන කොන්ත්‍රාත් කිහිපයක් එකවිට ඇගයීම සිදු වීම හා එකම ආකාරයේ ව්‍යාපෘති එකවිට ඇගයීම පහසුවීම යන කරුණු මත එම ඇස්තමේන්තු ඇගයීම් සඳහා ප්‍රමුඛත්වය ලබාදේ. |
| iv. | මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමේ අරමුණින් සිදු කරන ඉදිකිරීම් සඳහා කැබිනට් මණ්ඩලය විසින් අනුමත කල ප්‍රතිපාදනයන් යටතේ වූ ඉදිකිරීම් නියමිත කාලවකවානුවලදී ඉදි නොවීම සහ ඒවා මහජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා යොදා ගැනීමට නොහැකි වීම ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ප්‍රමාදවීම හේතු වී ඇති අතරම ඉදිකිරීම් සඳහා වැඩිපුර ගෙවීමේ හැකියාවක් පැවතිය හැකිය යන සැකයද විගණනයේ දී බැහැර කළ නොහැකි විය. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා කඩිනමින් ලබා ගෙන අදාල කටයුතු සිදු කළ යුතු වීම. | කොන්ත්‍රාත් ආයතන ප්‍රමාණ පත්‍ර සැකසීම දල ඒකක මිල ගණන් යෙදීමෙන් වෙළඳපල පවතින මිල ගණන් හා අනුමත මිල ගණන් හා මිල විශ්ලේෂණය කිරීමත් සලකා මිල තීරණය කිරීම සිදු විය. අනුමත මිල ගණන්වලට වැඩි මිල ගණන් යෙදීම කොන්ත්‍රාත් මුදල අඩුවීමට හේතුවන අතර මුල් ඇස්තමේන්තුව සඳහන් වැය විෂයයන් ඉටු නොකිරීම කොන්ත්‍රාත් මුදල අඩු වීමට හේතු වේ. කොන්ත්‍රාත්තුව ආරම්භ වී |

| | | |
|---|---|---|
| | | වසර කිහිපයකට පසුව කමිටු අනුමැති ඉල්ලීම හා කොන්ත්‍රාත්කරු වැඩි මිල ගණන් යොදා ඇතිද යන්න සලකා බලා ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලැබෙන තෙක් මිල ගණන්වල යම් ප්‍රතිශතයක් වන ලෙස කොන්ත්‍රාත්කරුවන් හට ගෙවීම කොන්ත්‍රාත් ලබා දෙන ආයතනයේ ද වගකීමකි. |
| **(ආ)** ආදර්ශ ගම්මාන හා නිවාස ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීම | | |
| i. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2018 මැයි 01 දැනැති අංක 8/4/1/1/76/3 ලිපියෙන් සහ නිවාස හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිවාස හා සංවර්ධන අතිරේක ලේකම් විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද 2018 අගෝස්තු 28 දිනැති අංක 3/1/2/33 ලිපිය අනුව, නිවාස යෝජනා ක්‍රම ඉදිකර ඇති රජය සතු ඉඩම් 304 ක් සහ පෞද්ගලික ඉඩම් 64 ක පමණ සංඛ්‍යාවක් 2018 වර්ෂයේ අවසාන වන විටත් පවරා ගෙන නොතිබුණි. රජය සතු ඉඩම් නිදහස් දීමනා පත්‍ර මගින්ද පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්පත් කිරීමේ පනත යටතේ වන්දි ගෙවා පවරා ගෙන නොතිබුණි. | නිවාස ඉදිකිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම් / පවරා ගැනීම් කල යුතු වීම. | 2018 වසර අවසාන වන විට නව සහ පැරණි නිවාස ව්‍යාපෘති ඉදිකරන ලද රජය සතු ඉඩම් 260 ක් රජයේ ඉඩම් ආඥා පනත යටතේ පැවරුම් කටයුතු සිදු වෙමින් පවතී. වර්තමානය වන විට නව ව්‍යාපෘති ඉදිකිරීමත් සමග එම ඉඩම් සංඛ්‍යාව 304 දක්වා වර්ධනය වී ඇති බව සඳහන් කල යුතුය.<br>2018 වර්ෂය අවසාන වන විට අත්පත් කිරීමේ කටයුතු සිදු වෙමින් පැවතුනු ඉඩම් සංඛ්‍යාව 64 ක් වේ. එම ඉඩම් සංඛ්‍යාව තුල ඉඩම් අත්පත් පනතේ 17 වගන්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි මුදල් දන්වා ඇති ඉඩම් මෙන්ම ඊට පහල අදියර වල පවතින ඉඩම්ද ඇතුලත් වේ. මෙම සියළුම පෞද්ගලික ඉඩම් පැරණි නිවාස යෝජනා ක්‍රම ඉදිකරන ලද ඒවාය. |
| ii. 2018 වර්ෂයේ අත්පත් කරගත් ඉඩම් 14 ක් සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉල්ලුම් කර ඇති මුදල රු.27,744,486 ක් වුවද මහා භාණ්ඩාගාරය විසින් ලබාදී ඇති | වන්දි ගෙවිය යුතු ඉඩම් සඳහා වන්දි ගෙවීම නියමිත පරිදි කල යුතු වීම. | 2018 වර්ෂය ආරම්භ වන විට ඉඩම් 14 ක් සඳහා වන්දි හා වන්දි පොලිය ගෙවීම සඳහා |

| | | |
|---|---|---|
| රු.මිලියන 10 ක ප්‍රතිපාදන මුදලින් ඉඩම් 02 ක සහ තවත් ඉඩමක කොටසක් සඳහා පමණක් වන්දි මුදල් ගෙවා තිබුණි. ඉතිරිය වූ රු.17,744,486 ක මුදල ගෙවා නොතිබුණු අතරම ඒ සඳහා ගෙවිය යුතු පොලියද දිගින් දිගටම එකතු වී තිබුණි. | | රු.27,744,486/- ක මුදලක් අවශ්‍ය වී ඇත. භාණ්ඩාගාරයෙන් ඉහත මුදල ලබා දෙන ලෙස කල ඉල්ලීමට රු.මිලියන 10 ක් ලබා දීමෙන් ඉඩම් දෙකක වන්දි මුදල හා ඉඩමක වන්දියෙන් කොටසක් පමණක් ලැබූ මූල්‍ය ප්‍රතිපාදන මත ගෙවන ලදි. එසේ වුවද වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පනතේ විධිවිධාන අනුව ගෙවිය යුතු පොලිය වැඩිවේ. |
| iii. ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක විසින්, ලේකම් නිවාස, හා සංස්කෘතික කටයුතු අමතන ලද 2017 දෙසැම්බර් 29 දිනැති BD/RDS/123/1/9/4 ලිපියෙන් ඉදිරියේ දී නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු වහාම අවසන් කිරීමට ක්‍රියා කළ යුතු බව අවධාරණය කර තිබුණද වර්තමානයේද ඉඩම් අත්පත් කර ගැනීමකින් තොරව නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති බව අනාවරණය විය. | නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් පවරා ගැනීම් හෝ අත්පත් කර ගැනීම් කල යුතු වීම. | ඉදිරිපත් කර ඇති ලේඛනයට අනුව ඉඩම් 38 ක තොරතුරු අනුව එම ඉඩම් 26 ක් පවරා ගැනීම සඳහා අදාල දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් දේපළ කළමනාකරණ කොට්ඨාශය වෙත නිර්දේශයන් එවා ඇති අතර නිදහස් දීමනා පත්‍ර මගින් එම ඉඩම් පවරා ගැනීම සඳහා ඉඩම් පැවරුම් අංශය මගින් කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි ඉඩම් සඳහා තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ලබාදුන් පසුව පැවරුම් කටයුතු ඉදිකිරීම් සිදු කරන කාලය අතර සිදු කරයි. |
| iv. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලට අදාල ඉඩමේ භුක්තිය 1999 සැප්තැම්බර් 30 දින ගම්පහ ප්‍රාදේශීය ලේකම් වෙතින් භාරගෙන තිබුණද අදාල | ඉඩම් පවරා නොගෙන ගොඩනැගිලි ඉදි කිරීම තුලින් කුලී ගෙවීම් වලක්වා | පර්චස් 52.4 ක පමණ විශාලත්වයකින් යුතු නාගරික ප්‍රදේශයක පවතින මෙම ඉඩම නිවස අවශ්‍යතාවය සපුරාලීම |

| | | | |
|---|---|---|---|
| | ඉඩම පවරා නොගෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් වියදම් දරා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර අධිකාරියේ කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබුණි. ගම්පහ ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත ගොඩනැගිල්ලට කුලී මුදල් වශයෙන් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.2,280,000 ගෙවන ලෙස 2016 සැප්තැම්බර් 29 දිනැති ගම්/ප්‍රාලේ/2/2/2/39(4) ලිපියෙන් දැනුම් දී තිබුණි. | ගැනීම සඳහා ඉඩම් පවරාගෙන ගොඩනැගිලි ඉදිකිරීම් කලයුතු වීම. | සඳහා කාර්යාල පරිශ්‍රයක් සහිත මහල් නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීමට හැකියාව පවතින බව නිරීක්ෂණය වේ. එබැවින් එවැනි නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඉඩමේ හිමිකම රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍රයක් මගින් ඉඩම පවරා දෙන ලෙස නැවත ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇත. |
| v. | ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති සඳහා ජලය නොමැති වීම හේතුවෙන් නිවාසලාභීන් පදිංචි කරවීමේ ගැටළු පැන නැගී ඇති අවස්ථා විගණනයේ දී අනාවරණය විය. මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වර්ෂයේ ආරම්භ කරන ලද බොරළුවලයාය ආදර්ශ ගම්මානයේ නිවාස 36 ක් ජානීය ජල පහසුකම් නොමැති වීමෙන් 2018 වර්ෂයේ දී ජනතා අයිතියට පත් කිරීම ගැටළු සහගත වී තිබුණි. | නිවාස ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යනයක් කර අදාල නිර්දේශ අනුව ක්‍රියා කල යුතු වීම. | 2016 වර්ෂයේ නිවාස 36 ක් තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බොරළුවලයාය ගම්මානයේ ඉදිකලද පානීය ජල ගැටලුව පවතින හෙයින් අමාත්‍යවරයා විසින් කෙටි කාලීන විසඳුමක් ලෙස වතුර ටැංකි ලබාදී බවුසර් මගින් සතියකට දෙවරක් ජලය දීමට කටයුතු යොදා ඇත. |
| vi. | රත්නපුර ගල්කඩුවත්ත ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා රු.8,686,000 ගෙවන ලෙස 2000 මැයි 06 දින නාගරික සංවර්ධන අධිකාරිය දන්වා තිබුණි. එහෙත් එම මුදල 2012 මාර්තු 20 ගෙවා තිබුණද ප්‍රමාදවීම හේතුවෙන් ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පවරා දීමට රු.145,530,000 ක නව තක්සේරු වටිනාකමක් ගෙවන ලෙස නැවතත් නාගරික සංවර්ධන අධිකාරිය දැනුම් දී තිබුණි. | සාකච්ඡා කර වර්තමානයේ පවතින තත්වය නිවැරදි කල යුතු වීම. | ගල්කඩුවත්ත ඉඩම පවරා ගැනීම සඳහා රු.8,686,000/- ක මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඇතත් නව තක්සේරු වටිනාකම යටතේ එම ඉඩම පවරා නොගැනීමට කළමනාකාරීත්වය තීරණයක් ගෙන ඇත. එබැවින් ගෙවා ඇති මුදල් නැවත ලබා දෙන ලෙසට එම ආයතනය වෙතින් ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීමට අනුව බැහැර කර ඇති ඉඩම් කොටසේ තක්සේරුව අඩු කර ඉතිරි මුදල ජාතික නිවාස |

| | | |
|---|---|---|
| | | සංවර්ධන අධිකාරිය වෙත නැවත ලබා දෙන බවට නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලිඛිතව දන්වා ඇත. |
| (ඇ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 25/2018-2018 ජුනි 11 හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ PED/INF/123/000/ CM/389 හා 2018 ජුනි 22 දිනැති ලිපිය ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය කිරීමේ දී විශේෂ කාර්යභාරයක් ඉටු කිරීම සඳහා රජයේ කර්මාන්තශාලා ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් පත්කල විද්වත් කමිටු වාර්තාව 2019 අප්‍රේල් මස අවසාන වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | විද්වත් කමිටු වාර්තාව ලබා ගැනීමට කටයුතු කර එම වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කල යුතු වීම. | එම අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව විද්වත් කමිටු වාර්තාව මෙතෙක් සම්පූර්ණ වී නොමැති අතර නොපමාව එය පිළියෙල කොට විගණනයට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

**4.** **යහපාලනය**

**4.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ එවකට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2017 දෙසැම්බර් 29 දින හා අංක BD/RDS123/1/9/4 දරන ලිපියෙන් වන්දි මුදල ඉල්ලුම් කර ඇති ඉඩම් මීට වසර 20 කට පෙර අත්පත් කර ගෙන නිවාස ක්‍රම ඉදිකර ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් අදාල ඉඩම් හිමියන්ට වන්දි මුදල් ද ගෙවා නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම් හා ඊට අදාල වන්දි ගෙවීම් කල යුතු වීම. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් පැරණි නිවාස යෝජනා ක්‍රම ඉදිකරන ලද පෞද්ගලික ඉඩම් විශාල සංඛ්‍යාවක් පැවති අතර, ඒවා බොහොමයක අත්පත් කටයුතු අවසන් වීමෙන් පසුව මේ වන විට ඉතිරිව ඇත්තේ ඉඩම් 64 ක් වැනි සංඛ්‍යාවකි. මෙම ඉඩම් වල අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කර දෙන ලෙසට එම එක් එක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් ඉල්ලීම් කරනු ලබයි. |

| | | |
|---|---|---|
| | | නීතිමය කටයුතුවලට යොමු වීම හේතුවෙන් ප්‍රමාද වීමට සිදු වේ. |
| (ආ) පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණද එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම හේතුවෙන් නිවාසවල නීත්‍යානුකූල අයිතිය නොලැබීමෙන් ඔවුන්ටද බලවත් අසාධාරණයක් සිදු වී තිබුණි. බොහෝවිට ලබා දී ඇති ඉඩමෙහි නිවාසලාභීන් නිවෙස් ඉදිකර ඇත්තේ රජය මගින් ලබා දෙන ලද ණය මත හා ඔවුන්ගේ පෞද්ගලික මුදලින් බව විගණනයේ දී අනාවරණය විය. | පදිංචි නිවාස ලාභීන්ට ඔප්පු ලබා දීමට කටයුතු කල යුතු වීම. | ප්‍රථමයෙන් නිවසේ/ඉඩමේ හිමිකම ලබා දීමට කටයුතු කරන අතර ඉඩම්වල හිමිකම විධිමත්ව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමෙන් පසුව සිදු කෙරේ. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------------- |
| (අ) අමාත්‍යාංශයේ තනතුරු පුරප්පාඩු 34 ක් පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශයට අයත් ආයතනවලින් වැටුප් ගෙවනු ලබන නිලධාරින් 17 දෙනෙකු 2007 දෙසැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ වරින් වර අමාත්‍යාංශයේ රාජකාරි කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි. අමාත්‍යාංශයේ පුරප්පාඩු පැවතියදී අමාත්‍යාංශය මගින් වැටුප් ගෙවන නිලධාරිනියක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රාජකාරි සඳහා නිදහස් කර තිබුණි. | අමාත්‍යාංශය විසින් පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම හෝ එම තනතුරු අවශ්‍ය නොවේ නම් ඒවා යටපත් කල යුතු වීම. | මෙම අමාත්‍යාංශයට අයත් ආයතනවලින් වැටුප් ගෙවනු ලබන නිලධාරීන් 17 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයෙහි යොදවා ඇත. ඒකාබද්ධ සේවාවන්ට අයත් අමාත්‍යාංශයේ තනතුරුවල පුරප්පාඩු පිරවූ වහා අදාල නිලධාරීන් නිත්‍ය සේවා ස්ථාවලට මුදා හරිනු ලබයි. එමෙන්ම අමාත්‍යාංශය මඟින් වැටුප් ගෙවන නිලධාරිණියක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රාජකාරි සඳහා නිදහස් කර ඇතත් 2015 වර්ෂයේදී එම නිලධාරිණිය අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කරමින් |

| | | |
|---|---|---|
| | | සිටින අතරතුර මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ අංක මැ.පෞ.ලි. 1352 හා 2016.05.23 දිනැති ලිපියට අනුව ඇය නැවතත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි. කෙසේ වුවද මෙම නිලධාරිණිය නැවත මෙම අමාත්‍යාංශය වෙත මුදා ගැනීමට කටයුතු කරමින් පවතින බව වැඩිදුරටත් දන්වා සිටිමි. |
| (ආ) 2018 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| i. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව ශ්‍රී ලංකා රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස යොදා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබුණි. ඒ අනුව රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම් සහගතව සංවර්ධනය කිරීම අවශ්‍යතාවය මත කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු විය. එහෙත් අමාත්‍යාංශය එම සැලැස්ම පිළියෙල කර ඒ අනුව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා යොදවා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතුවන අතර කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම පුහුණුවීම් අවස්ථා ලබා දීමට කටයුතු කල යුතු වීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 02/2018 පරිදි 2018 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර නොතිබූ බව පිළිගනිමි. ඉහත චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කර නිලධාරීන් පුහුණු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |
| ii. 2018 වර්ෂයේ අමාත්‍යාංශයේ තථ්‍ය සේවක සංඛ්‍යාවෙන් පුහුණු වීම් සඳහා යොදවා තිබුණේ ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ නිලධාරින් 10 දෙනෙක් ද්විතියික මට්ටමේ නිලධාරින් 36 ක් හා ප්‍රාථමික මට්ටමේ නිලධාරින් 09 දෙනෙකු පමණි. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරින් 107 කට (මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 66 කට) කිසිදු පුහුණුවක් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | සියලු සේවකයන් සඳහා පුහුණුවීම් අවස්ථා ලබා දීමට කටයුතු කල යුතු වීම. | පුහුණු වැඩසටහන් සඳහා අංශ ප්‍රධානීන්ගේ නිර්දේශ මත විෂයභාර නිලධාරීන් 60 දෙනෙකු පමණ අදාල වැඩසටහන් සඳහා සහභාගී කරවූ අතර අනෙකුත් නිලධාරීන්ට 2019 වර්ෂයේ දී පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරමි. |